ධම්මික විජේසිංහ
සුබෝධා ජ්‍යොතිශ සේවය - මෙල්බර්න්




# ප්‍රේම විවාහ, යෝජිත විවාහ හා විවාහ දෝෂ

සමාජයේ කුඩාම ඒකකය වන්නේ පවුලයි. ගැහැණියක් හා පිරිමියෙක් එක්ව වාසය කිරීමෙන් දරුවන් බිහිකිරීමෙන් හා ඔවුන්ව නිසි ලෙස පෝෂණය කිරීමෙන් (ශාරීරිකව හා යහ දැනුමෙන්) සමාජයට හා මානව සංහතියට එමගින් විශාල මෙහෙවරක් ඉටුවෙයි. සමාජය තුල වැඩියෙන්ම ජනප්‍රිය  වි තිබෙන්නේ ප්‍රේම සම්බන්ධතා මත සිදුවන විවාහ හා යෝජිත විවාහයි.

නමුත් බොහෝදෙනා යෝජිත විවාහයන් වලට සමානාත්මක ආකල්පයක් දක්වන්නේ එහි -ආදරය" යන සංකල්පයට වැඩි ඉඩක් නොපවතින නිසායි. විවාහ ගිවිස ගැනීමෙන් පසුව හෝ විවාහයෙන් පසුව දෙදෙනා තුල බැඳීමක් හටගැනීමට ඇති ඉඩකඩ වැඩිවීම යෝජිත විවාහ සාර්ථකත්වයට වෙසෙසින් බලපායි. එයට ඇති පහසුව යම් සාධක ගැලපීමෙන් පසු දෙදෙනා හමුවීම තුල, බාධක



නැති වීමයි.

අනෙක් අතට බන්ධන වලින් වන විවාහ, බාධා අවහිර අඩුවැඩිවන ආකාරය අනුවත්, දෙදෙනා ඒවාට දක්වන ප්‍රතිචාර අනුවත් තීරණය වේ.

මේ දෙකෙන් ජ්‍යොතිශයට අනුව විශාල වශයෙන් පීඩාවට පත් වන්නේ හඳහන් නොගැලපෙන සහ දෙදෙනා අතර විවාහ දෝෂ පවතින ප්‍රේමවන්තයින්ය. සාමාන්‍යයෙන් දෙදෙනෙකු අතර ගැලපීමක් බැඳීමක් ඇතිවීමට අන්‍යොන්‍ය චරිත ලක්ෂණ, රුචි අරුචිකම්, රූප ස්වභාවය යනාදියද හේතු කාරක වේ. අත්දැකීම් හා පර්යේෂණවලට අනුව අව්‍යාජ ප්‍රේම බන්ධන හට ගන්නා බොහෝ දෙනෙක් අතර හඳහන් නිතැතින්ම ගැලපේ. නමුත් හඳහන් ගැලපීමේදී කුජ දෝෂ හා විවාහ දෝෂ පමණක් පැවතීමට ඉඩ කඩ ඇත. අඟහරු දෝෂය, අංගාර දෝෂය, මංගල දෝෂය,  භෞම දෝෂය යනුවෙන් හැඳින්වෙන්නේද කුජ දෝෂයි.

20 පොරොන්දම් හා කුජ දෝෂයට අමතරව ශනි මංගල දෝෂය, කඩහන්දි, මාරක දෝෂ, විෂ කන්‍යා දෝෂ, වැන්දඹු, බහු විවාහ, අවිවාහක හා සරාගී දෝෂ, වඳ දෝෂ, නාශාංශක දෝෂ, කළු කුමාර දෝෂ, පිළිසිඳගැනීමේ දෝෂ, ප්‍රසූත දෝෂ, ඍතු දෝෂ, තුන් කුළුඳුල් දෝෂ, ලේ නෑ කම් දෝෂ හා චාරිත්‍ර දෝෂ ආදියද පරීක්ෂා කළ යුතු දැයි.

වර්තමානයේ බොහෝ ජ්‍යොතිශවේදීන් යට කී සියල්ලම සලකා නොබලන නමුත්, 20 පොරොන්දම් වලින් අත්‍යාවශ්‍ය ඒවා හා කුජ දෝෂය සැලකිල්ලට ගෙන විවාහ අනුමැතිය දෙනු ලබයි.

කුජ දෝෂය යනුවෙන් හැඳින්වෙන්නේ ජන්ම කේන්ද්‍රයේ 1,2,4,7,8,12 යන ස්ථානයක කුජ (අඟහරු) තැන්පත් වීමයි. (ඇතැම් පොත්පත් වල ලග්නයෙන් පමණක් නොව චන්ද්‍රයාගෙන්, සිකුරාගෙන් 1,4,7,8,12 යන ස්ථානයක කුජ පිහිටන විටද මෙම දෝෂය යෙදෙන බව සඳහන් ය.)

එනමුත් මධ්‍යම ප්‍රතිපදාව අනුව පිලිගත් සාමන්‍ය ප්‍රායෝගික ක්‍රමය වන්නේ මුලින් කී ලග්නයන් ගැන බලන ක්‍රමයයි.

දෙදෙනාගේම කේනද්‍රවල දෝෂය යෙදීමෙන් දෝෂ භෘගවේ. (ඉහත සඳහන් අනෙකුත් විවාහ දෝෂ ඉදිරි ලිපියකින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.)

භෞම දෝෂය භෘග නොවී විවාහය සිදුවුව හොත් දෙදෙනා අතර අඩදබර අසමගිකම්, දියුණුවට භාධක, අනතුරු විපත් ලෙඩදුක් යානාදියටත්, මොනයම් අකාරයකට හෝ වෙන්වීමක් සිදුවීමටත් ඉඩ ඇතැයි සැලකේ.

වරක් මාගේ මිතුරෙක් හට විවාහ යෝජනා ගෙන ඒමට ඔහුගේ වැඩිමහල් සොයුරු සොයුරියෝ කටයුතු කළහ. ඒවා සැසඳීම භාර වූයේ මා හටයි. විවිධ කාරණා මත සමහර කේන්ද්‍ර ප්‍රතික්ෂේප වූ අතර භෞම දෝෂය මත නොගැලපුන, හෙදියක් වන තරුණියක් කෙරේ මිතුරා විශේෂත්වයක් දක්වන්නට විය. ඔහු මට ඒ බව පවසන විතේ දෙදෙනා අතර ප්‍රේම සම්බධවක් ඇතිවී තිබිණි.

"මේකට මොකක් හරි පිළියමක් නැති වුණත් කමක් නැහැ. අපි විවාහ වෙනවා" ඔහු පැවසිය. සියළුම මංගල නැකැත්ද මා අතින්ම පිලියෙල කරවා ගැනීමට ඔහුට අවශ්‍ය වූයෙන් ඒ අනුවම සිදුවිය.

නමුත් හිතුමතයට ගත් තීරණයෙන් අනිටු ප්‍රතිපල ගෙන දීමට පටන් ගන්නා ලදී. කාරණය දත් මම ඔවුන් පිළිබඳව වෙසෙසින් විමසිලිමත් වීමි. මාගේ මිතුරා රාජකාරී කටයුතු සඳහා යන්නේ යතුරු පැදියෙනි. ඔහු කිහිප වරක්ම අනතුරට ලක්විය. රැකියාවේ ප්‍රශ්ණ, ස්ථානගත ප්‍රශ්ණ යනාදිය නිසා දෙදෙනා අතරද අසමගිකම් ගොඩ නැගෙන්නට විය. භෞම දෝෂයට පිළියම් යෙදීමේ පැරණි ක්‍රම පැවතීමට ඉඩ ඇතත් ඒවා සඳහන් පුස්කොල පොත්, ග්‍රන්ථ යනාදිය සුරක්ෂිතව නොපැවතීස නිසා කටයුත්ත භාරදූර එකක් විය.

මා මේ පිළිබඳව සොයන බව දත්, මා ගුරු තනතුරේ ලා සලකන ජ්‍යෂ්ඨ ජ්‍යොතිශවේදී මිතුරෙක් විසින් තොරතුරක් සපයන ලදී. එනම් දැනට 91 වියේ පසුවන පරිගණක විද්‍යාව මෙන්ම නොයෙකුත් ජ්‍යොතිශ විද්‍යාත්මක පර්යේෂණ වල නියැළුනු අග්ග මහා පණ්ඩිත ආචාර්ය බෙල්ලන ඥාණවිමල හිමිපාණන් විසින් පිරිත් ඇසුරින් සොයා ගන්නා ලද සාර්ථක අත්දුටු පිළියමක් වේය යන්නයි.

ඒ අනුව කල යුතු වතාවත්ද, පේවීම්ද මාගේ මිතුරාගේ පියා විසින්ම ඉටු කරන ලදී. එහි ප්‍රතිඵල ඉතා සාර්ථක විය. දැනට  මහනුවර ප්‍රධාන පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් මාගේ මිතුරාට නොබෝ දිනකින් උසස් වීමක්ද ලැබී නව නිවාසයක් සඳහා ඉඩම-ක්ද මිලදී ගත් බව පැවසුවේ කෘතවේදීවය.







## මං විතරක් උඹ හැමදා වාහේ කොර ගන්නයි

නෑම්බියන්ගේ කිචිබිචිය ඇහුණා මම හෙමිහිට වැට ඉමට කිට්ටු කළේ කාගේ එකීලද කියලා බලන්නයි. බොලේ හැබෑට මේ ගමන් ගස්සන්නෙ බණ්ඩිරාළගෙ කෙලි පැටික්කියො දෙන්න නොවැ. ලොකු එකී නම් හැබෑවට කැළෑවට පායපු හඳක් වගේ. ඒ වුණාට ඒකිගෙ මට රුස්සන්නෙ නැත්තෙ ගැස්සිල්ල නොවැ. වෙන දෙයක් වෙද්දෙන් කියාලා උගුර පෑදුවේ කවුරුවත් අහලක නැති නිසයි. හැරුණා නේද.

"නගා පය ඉක්මන් කර.. අපුච්චා හාමතේ.. තී පස්ස බලන්නෙ.. දළදා රටේ එකාලගෙ හැටි තෝ නොදැන.. " අක්කණ්ඩි නගාට කියනා හැටි මට යසට ඇහුණා. නගාට රවන්ඩත් ඇති මයෙ හිතේ.

"එහෙනං බෝ කියන්නෙ ඒ අයියන්ඩි උජාරුයි කියල .. ආං බල .. අපට කතා කරනවා.. " නගා කියන්නෙ හිනාවක් එක්කමයි.

අක්ණ්ඩිගෙ ගැස්සිල් දෙපිටින් යන්ට එක්ක යමක් කියන්ඩමයි මගෙ හිත කීවෙ.
"නගා.. එන ගමන මේ ඉමෙන්මද එන්නෙ..? අක්කණ්ඩිට කියාපන් දළදා රටේ පැණි කොමඩු නැතිය කියලා.. මං පැණි කොමඩු වලට මනාපය කියලා.. "

"එහෙනං අයියණ්ඩි උඹට මෙහෙ පැල් ගැහෙන්ට වෙයි ඕං.. ඔහොම ගෙරෙව්වට මේකි උඹට මනාපයි.." නගා කියන්ෙ අක්ණ්ඩිට පාරක් ගහන්ට බැරි වෙන්ඩ ටිකක් ඈතට යන ගමං. නගාගෙ කතාවට අක්කණ්ඩි තරහ ගත් බවක් නං පෙනුණොම නෑ.

"යම නගා යම.. අන්න කොයිං ආතා එනවා.." අක්කණ්ඩි නගාත් ඇදගෙන දුවන්ට තියා ගත්තා.

"අයියණ්ඩි උඹත් වරෙන් වෑ ඉස්මත්තට.. මං උඹට ගඩා ගෙඩි ඇහිඳලා දෙන්නං.." නගා ඈත යන ගමං කෑ ගහලා කිව්වා.

"කට කට තිගේ.. කොයින් ආතා.."

හැබෑටම මේකිට කවුද නම තිබ්බෙ..? නම මලී කීවට හැමෝම කියන්නෙ මලිත්ති කියලා..
ඒ අවි අස්සෙ කොයිං මාමාත් එනවා. උන්දැටත් ඕනෙ නැති කෙහෙම්මලක් නැහැ..

"මං බැලුවා නාම්බා කාටද කුයිල අල්ලන්නෙ කියලා.. මේ බණ්ඩි රාළගෙ නෑම්බියො නොවැ.. හොඳා හොඳා.. බලා නොඉඳ ආලවන්ත කම දිගේලි කර නෑම්බිගෙ කන් හොරොව්වට මේ මෙහෙම..

මගෙ විතරක් උඹෙ හැඩ රුව දෑහේ ගෑවෙන්නයි
මගේ විතරක් උඹේ පුසුඹ නාහේ      ගිල්වන්නයි
මගෙ විතරක් උඹෙ උණුහුම දේහේ    ගල්වන්නයි
මං විතරක් උඹ හැමදා වාහේ කොර     ගන්නයි"

ඔය විදියට කියලා කොයින් මාමා ඔලොක්කුවට හිනා වෙලා යන්ඩ ගියා.

කතාව එතනින් අහවර වෙන්නෙ නෑ ඕං.. පස්සෙන් පහු උණු ඒවා මං හෙමිහිට කියන්නද්දං..

බෝගල